# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2283/34 - 2022 ජුනි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2022.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2022 මැයි මස 27 දිනැති අංක 2281/41 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය, 2022 ජුනි මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2022 ජුනි මස 09 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි " අංක 01. ආරක්ෂක අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 18 සහ අංක 27 සිට 40 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 19 සිට 26 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 18 සිට 25 දක්වා වශයෙන් සහ අංක 41 සහ 42 අයිතමයන් පිළිවෙලින් අංක 26 සහ 27 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

1A - G 36919 — 366 (2022/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 23 සහ අංක 29 සිට 42 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 24 සිට 28 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 23 සිට 27 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)
- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)
- ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)
- විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)
- මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4)
- කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11)

(2) එම නිවේදනයෙහි "අංක 26. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය" ශීර්ෂයේ I වන, II වන සහ III වන තීරු වලට පසුව පහත සඳහන් නව ශීර්ෂ ඇතුළත් කිරීමෙන් ;

**27. තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම | 1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව<br>2. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>3. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ අනුබද්ධිත ආයතන<br>4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ඊට අනුබද්ධිත ආයතන<br>5. ශ්‍රී ලංකා පරිඝණක හදිසි ප්‍රතිචාර සංසදය<br>6. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන | • පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)<br>• ආගාමික හා විගාමික පනත (1948 අංක 20)<br>• පුරවැසි පනත (1948 අංක 18)<br>• ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)<br>• අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)<br>• අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)<br>• ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25) |

**27. තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු යහපත සුරකිමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ කටයුතු නියාමනය කිරීම<br>5. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.<br>6. අන්තර් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම තුළින් රජයේ සේවා සැපයීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ මූලාරම්භන සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය.<br>7. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.<br>8. සමාජයේ සියළුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය සහ පුද්ගලික අංශය සමඟ හවුල්වී තොරතුරු තාක්ෂණ මූලාරම්භයන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.<br>9. සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැළැක්වීම.<br>10. ඩිජිටල් ව්‍යවහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ලබාදීම.<br>11. තාක්ෂණ උද්‍යාන ඇති කිරීම.<br>12. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු | 7. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>8. ටෙක්නො පාක් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>9. තොරතුරු තාක්ෂණ උද්‍යාන (යාපනය සහ මන්නාරම)<br>10. කාර්මික තාක්ෂණ ආයතනය<br>11. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>12. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>13. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>14. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>15. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)<br>• ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)<br>• විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)<br>• මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (1978 අංක 4) (ශ්‍රී ලංකා මණ්ඩලය නීතිය)<br>• කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**27. තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 13. ප්‍රමිතීන් පැනවීම සහ පරිපාලනය සම්බන්ධ කටයුතු<br>14. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු<br>15. ආගමන හා විගමන කටයුතු<br>16. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම<br>17. කළාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය<br>18. ආර්ථික සංවර්ධන කළාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය<br>19. II තීරුවෙහි දැක්වෙන ආයතන යන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>20. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**28. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් විෂයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව<br>2. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br>3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>4. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>5. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය<br>6. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br>7. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය<br>8. ජාතික සමාජ සංවර්ධන ආයතනය<br>9. ග්‍රාම සංවර්ධන, පුහුණු හා පර්යේෂණ ආයතනය | • ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34)<br>• ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50)<br>• ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)<br>• දිවි නැගුම පනත (2013 අංක 1)<br>• ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත (1992 අංක 41)<br>• සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත (1996 අංක 17) |

**28. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරන ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම<br>5. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම<br>6. ගැටුම් වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>7. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>8. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැළකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br>9. කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br>10. කාන්තා හා ළමා කටයුතුවලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම<br>11. පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම | 10. සමාජ ආරක්ෂණ මණ්ඩලය<br>11. ආබාධ තැනැත්තන් සඳහා වන ජාතික සභාව<br>12. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය<br>13. සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>14. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය<br>15. වකුගඩු අරමුදල | • ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)<br>• දිළිඳු සහන පනත (1985 අංක 32)<br>• නිවර්තන නිවාස ආඥාපනත (1907 අංක 05)<br>• දරිද්‍රතා නීති ආඥාපනත (1939 අංක 30)<br>• අයාල ආඥාපනත (1841 අංක 4)<br>• වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9)<br>• දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය භාර අරමුදල පනත (1992 අංක 9)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**28. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 12. ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම<br>13. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙනසේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම<br>14. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම<br>15. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම<br>16. සෙවණ සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම<br>17. සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම<br>18. සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම<br>19. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකර දීම<br>20. මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම<br>21. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා සහ තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම<br>22. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම<br>23. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු | | |

28. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 24. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 25. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 26. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම | | |
| 27. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 28. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 29. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

EOG 06 - 0092

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.